**COVID 19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදල -2022**
---------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

COVID 19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලේ 2022 ඔක්තෝම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් මාස 10ක කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් මාස 10ක කාලපරිච්ඡේදය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 ඔක්තෝම්බර් 31 දිනෙන් අවසන් මාස 10 ක කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 ඔක්තෝම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් මාස 10ක කාලපරිච්ඡේදය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි, කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 145(1) | නියමිත කාර්යය සඳහා නීතියෙන් වෙන් කරනු නො ලැබූවාවූ ද, ජනරජය සතුවූ ද, සියළුම අරමුදල් එක්ව ඒකාබද්ධ අරමුදල සමන්විත වන අතර සියළුම අයබදු, තීරුබදු, වරිපනම් හා ගාස්තු යන මාර්ගවලින් ලැබෙන ආදායම් ද, නියමිත කාර්යය සඳහා වෙන් කරනු නොලැබූ ජන රජය සතු සෙසු සියළුම ආදායම් සහ ලැබීම් ද ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු වුවද . 2022 ඔක්තෝබර් 10 දිනැති අමප/22/1608/601/018 අංක දරණ කැබිනට් තීරණ අනුව 2022 ඔක්තෝබර් 28 දිනට කොවිඩ් 19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලේ රු.218,712,624 ක මුදල් ශේෂය ජනාධිපති අරමුදල වෙත මාරු කර තිබුණි. | 2022 ඔක්තෝබර් 10 දිනැති අමප/22/1608/601/018 අංක දරන කැබිනට් තීරණය මගින් අනුමැතිය ලබා දී ඇති බැවින් 2022 ඔක්තෝබර් 28 දිනට කොවිඩ් 19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලේ මුදල් ශේෂය ජනාධිපති අරමුදල වෙත මාරු කරන ලද බව දන්වා තිබුණි. | නීතිරීති විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,728,167,492 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 274,070,004 ක අතිරික්තයක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,002,237,496 ක පිරිහීමක් නිරීක්ෂණය විය. අරමුදල විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයීම් සඳහා වන හිඟ බිල්පත් නිරවුල් කිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත රු 1,800,000,000ක් ලබාදීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 ජුනි 06 වන දින පවත්වන ලද කොවිඩ් 19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂන අරමුදලේ කළමනාකරණ කමිටු රැස්වීම් තුලින් කොවිඩ් 19 වසංගතය හේතුවෙන් තම දෙමාපියන් අහිමි වූ දරුවන් සඳහා අධ්‍යාපන ශිෂ්‍යත්ව පිරිනැමීමේ වැඩසටහන් ක්‍රියාවට නැංවීම යන යෝජනාව ක්‍රියාත්මක කිරීමට අවධානය යොමුව තිබුණද ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන තිබූ බව විගණනයට නිරීක්ෂණය නොවිය. | ගිණුම වසා දැමීමට අවශ්‍ය මූලික කටයුතු සැලසුම් කර තිබූ බැවින් , ශිෂ්‍යත්ව පිරිනැමීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට නොහැකිවූ බව දන්වා තිබුණි. | කළමනාකරණ කමිටු තීරණ ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය |
| (ආ) | අරමුදල සඳහා ක්‍රියාකාරී සැලැස්මක් හා එහි ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් සකස් කර නොතිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය සහ ,20212022 වර්ෂ තුළ රටේ පැවති සීමාකාරී තත්ත්වයන් මත රාජ්‍ය සේවකයන් චක්‍රීය ක්‍රමයට සේවයට කැඳවීමත්, ජනාධිපති ලේකම් කාර්යාලය කේන්ද්‍ර කරගනිමින් පැවැති අරගල ක්‍රියාමාර්ග හේතුවෙන් ජනාධිපති කාර්යාලයේ අත්‍යාවශ්‍ය සේවා කටයුතු අවම සේවක සංඛ්‍යාවක් මඟින් පවත්වා ගෙන යාමත් හේතුවෙන් අරමුදල සඳහා ක්‍රියාකාරී සැලැස්මක් හා එහි ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් සකස් කිරීමට නොහැකි වී ඇති බව දන්වා තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මක් හා එහි ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් සකස් කළ යුතු වීම. |

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| Covid 19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදල ඖෂධ උපකරණ ඇතුළු සෞඛ්‍ය සේවා සැපයීම යන ප්‍රධාන අරමුණට අමතරව පහත සඳහන් පරමාර්ථ සපුරා ගත යුතුව තිබුණි.<br>• ළමයින්, කාන්තාවන්, අඩු ආදායම් ලබන | ගිණුම වසා දැමීමට අවශ්‍ය මූලික කටයුතු සැලසුම් කර තිබූ බැවින්, ශිෂ්‍යත්ව පිරිනැමීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් | කළමනාකරණ කමිටු තීරණ ක්‍රියාත්මක කළ යුතු වීම. |

පුද්ගලයින්, වයස්ගත, ආබාධිත හා අවධානම් පුද්ගලයින් වෙත මූලික අවශ්‍යතා සැපයීම.

- ග්‍රාමීය හා දුරස්ථ බෙහෙත් ශාලා සඳහා මූලික පහසුකම් ලබාදෙමින් පොදු සෞඛ්‍ය අංශය ශක්තිමත් කිරීම.
- දේශීය අමුද්‍රව්‍ය, සම්පත් දැනුම සහ නිපුණතා උපයෝගී කර ගනිමින් සනීපාරක්ෂක නිෂ්පාදන නිෂ්පාදනය සහ බෙදා හැරීම සඳහා දේශීය වෛද්‍ය ඒකකවලට උපකාර වීම.
- උසස් ගණයේ ආරක්ෂිත ඇඳුම් සහ සනීපාරකෂක නිෂ්පාදන ගෝලීය වෙළඳපලට සැපයීමට නවෝත්පාදන සහ පරීක්ෂණ ප්‍රවර්ධනය කිරීම.

එහෙත් එම පරමාර්ථ උදෙසා මුදල් උපයෝජනය කර නොතිබුණු අතර අරමුදලට ලැබුණු මුදලින් එකතුව රු.1,663,886,025 ක් ස්ථාවර තැන්පතු හා වෙනත් තැන්පතු වල ආයෝජනය කර 2022 ඔක්තෝබර් 31 දිනට රු.50,277,518ක පොලී ආදායමක් උපයා ගැනීමට කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය විය.

ගැනීමට නොහැකිවූ බව දන්වා තිබුණි.